## ශ්‍රී ලංකාවේ පිරිමින් අතර බහුලම පිළිකාව
## මුඛ පිළිකාවයි

මුඛ පිළිකා නිසා දිනකට ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකුවත් මිය යයි

මුඛ පිළිකාව ඇති වීම වළක්වා ගත හැක්කේ අවදානම් සාධකවලින් වැළකී සිටීමෙනි

### මුඛ පිළිකාව ඇතිවීමට හේතුවන ප්‍රධාන සාධක



බුලත් විට සැපීම



පුවක් සහ පුවක් පැකට් සැපීම



දුම්පානය
(සිගරට්, බීඩි, සුරුට්ටු)



මත්වතුර පානය

### මුඛ පිළිකා ඇතිවීමට හේතුවන අනෙකුත් සාධක

- පෝෂණ ඌනතාවය
- අයහපත් මුඛ සෞඛ්‍යය
- හියුමන් පැපිලෝමා වෛරස් ආසාදනය

### මුඛ පිළිකා වැලඳීමේ වැඩි අවදානමක් ඇති පුද්ගලයන්

- දවසකට බුලත්විට 3 කට වඩා සපන අය
- දවසකට බුලත් විට 1-3 අතර සපන, අවුරුදු 30 ට වැඩි, පුරුද්දක් ලෙස දුම්පානය කරන සහ සතියකට වතාවක්වත් මත්වතුර පානය කරන අය
- දවසකට පුවක් පැකට් එකක්වත් සපන අය

**ඉහත සඳහන් අවදානම් සහිත පුද්ගලයන් වහාම ළඟම සිටින දන්ත වෛද්‍යවරයා හමුවී මුඛය පරීක්ෂා කරවාගන්න**



### මුඛ පිළිකාවක් ඇතිවීමට පෙර බොහෝවිට මුඛයේ දැකිය හැකි වෙනස්කම්



කල් පවතින සුදු ලප



කල් පවතින රතු ලප



කල් පවතින සුදු සහ රතු මිශ්‍ර ලප



මුඛයේ අසාමාන්‍ය දැවිල්ලක් සමග තොල් සහ ශ්ලේෂ්මලයේ ඝන වීමක් සහ සුදුමැළි වීමක්



කාලයක් පවතින සුව නොවන තුවාලයක්

- තමා විසින්ම මුඛය පරීක්ෂා කරගැනීම මගින් මෙම රෝග ලක්ෂණ පහසුවෙන් හඳුනාගත හැකිය.
- ඔබට ඉහත සඳහන් යම්කිසි රෝග ලක්ෂණයක් ඇතිනම්, වහාම ළඟම සිටින දන්ත වෛද්‍යවරයා හමුවන්න.